ඉරුරැස

2010 සැප්තැම්බර් මස 05 වැනි ද ඉරිද

ලීඩර් ප්‍රකාශන පෞද්ගලික සමාගම,
24, කටුකුරුඳුවත්ත පාර, රත්මලාන.

කර්තෘ මණ්ඩලය : 4341875
දැන්වීම් අංශය : 7431566
බෙදාහැරීම් අංශය : 4954106
ෆැක්ස් : 7247222
ඊ මේල් : editor@iruresa.lk
වෙබ් අඩවිය : www.iruresa.lk

# විපක්ෂය ශක්තිමත් නොවීමේ අනතුර

ජනාධිපතිවරයකුට තරග කළ හැකි වාර ගණන දෙකකට සීමා කරමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කර තිබූ 8.1 වගන්තිය ඉවත් කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර සපුරාලමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පසුගිය සතියේදී ඊට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත්තේය. මාධ්‍ය වාර්තා කර ඇත්තේ 18 වැනි ව්‍යවස්ථා සංශෝධනය නමින් හැඳින්වෙන මෙම කෙටුම්පත හදිසි පනතක් සේ එළඹෙන 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඊට පසුදින මන්ත්‍රීවරුන්ගේ ඡන්දය විමසීමට සූදානම් කොට ඇති බවය.

දැනටමත් මීට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සම් හතක් ගොනු වී ඇති අතර දේශපාලන පක්ෂ හා පෞද්ගලික මට්ටමින් ඉදිරිපත් වී ඇති එම පෙත්සම්වලින් ඉල්ලා ඇත්තේ මෙය අතිශය වැදගත්, රටේ ඉදිරිගමනට බලපාන ව්‍යවස්ථා සංශෝධනයක් වන බැවින් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතරයට අමතරව ජනමත විචාරණයක් සඳහා ඉදිරිපත් කළ යුතු බවට නියෝගයක් නිකුත් කරන ලෙසය. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ පක්ෂ මුල් පියවර තබා තිබේ.

කෙසේ වෙතත් මෙහිදී රටේ තනි ප්‍රධාන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය, විපක්ෂයේ ද ප්‍රධාන පක්ෂය වශයෙන් රජයේ මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී, සදාචාරාත්මක නොවන ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව සිදු කරනු ලබන කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳ ව අපට ඇත්තේ විශාල ගැටලුවකි. අප කව්රුත් දන්නා පරිදි ලොව හොඳම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහය පවතින බවට විශ්වාස කෙරෙන අමෙරිකාවේ පවා ජනාධිපති ධුරය වාර දෙකකට සීමා කොට ඇත. ලොවට ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන් ප්‍රංශයේ පවා පවතින්නේ වාර දෙකකට පමණක් සීමා කරන ලද ජනාධිපති ධුරයකි. ශ්‍රී ලංකාවේදී ජනාධිපති ධුරය වාර දෙකකට සීමා කොට පැවතියද අමෙරිකානු හා ප්‍රංශ ජනාධිපතිවරුන් භුක්ති නොවිඳින වරප්‍රසාද විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා භුක්ති විඳී. නීතිමය මුක්තිය ඉන් එකකි. නියමින් හෝ අනියමින් අධිකරණයත්, ව්‍යවස්ථාදායකයත් පාලනය කිරීමේ වරප්‍රසාදය තවත් එකකි. එම තත්ත්වය වළක්වාලීමට සංවරණ හා තුලන නීති පැවතියද මේ වන විට ඒවා පවතින්නේ අක්‍රීයවය. නැතහොත් ඒවා වුවමනාවෙන්ම අකර්මණ්‍ය කොට දමා ඇත.

මෙවන් තත්ත්වයක් පැවතියදී යම් ජනාධිපතිවරයෙක් අත්තනෝමතිකව කටයුතු කරන්නේ නම්, බලතල තමාගේ හෝ පවුලේ උන්නතිය සඳහා පමණක් නිර්ලජ්ජිත ලෙස යොදාගන්නේ නම්, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මයන් එකින් එක බිඳ දමමින් ඒකාධිපති පාලනයක් කරා ගමන් කරන්නේ නම් ඔහු හෝ ඇය එම තනතුරින් ඉවත් කළ හැක්කේ දෝෂාභියෝගයක් ඉදිරිපත් කිරීමෙන් පමණි. එවැන්නක් ජනාධිපති ක්‍රමය හඳුන්වා දී ගෙවුනු වසර 32 තුළ ප්‍රායෝගිකව සාර්ථක වී නොමැති අතර අනාගතයේ හෝ සාර්ථක වෙතැයි සිතිය නො හැක්කේ එය සාර්ථක කරගැනීමට ව්‍යවස්ථාව තුළම පවතින බාධා නිසාය. එසේ තිබියදී වාර දෙකකින් ස්වාභාවිකව ම ඉවත්විය යුතු ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක්ද සහිතව සීමාරහිත ජනාධිපති ධුරයකට උරුමකම් කිවහොත් තත්ත්වය කුමන අතකට පෙරළෙනු ඇති දැයි සිතාගැනීම එතරම් අපහසු නැත.

වර්තමානයේ රට තුළ සිදුවන දෑ සහ පසුගිය කාලසීමාව තුළදී (විශේෂයෙන්ම යුද ජයග්‍රහණයෙන් පසුව) රටේ සිදුවූ දෑ සම්බන්ධයෙන් අවදි සිහියකින් සහ අවබෝධ මනසකින් යුතුව බැලුවහොත් රට ගමන් කරමින් සිටින්නේ කවර නම් දිශානතියකට ද යන්න අවබෝධ කරගැනීම අපහසු නැත. අද රටේ නීතියක් නැත. විනයක් නැත. පාලනයක් නැත. ඇත්තේ රාජපක්ෂවරුන්ගේ නීතියයි. ඇත්තේ රාජපක්ෂවරුන්ට අවශ්‍ය ආකාරයේ විනයකි. ඇත්තේ රාජපක්ෂවරුන්ගේම පාලනයකි. ඒ පාලනයට 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ රටේ යහපාලනයක් උදෙසා පිහිටවූ ස්වාධීන කොමිසම් ගෝචර නැත. ඒ පාලනය යටතේ ස්වාධීන පොලිස් සේවයක්, රාජ්‍ය සේවයක්, මැතිවරණ කොමිසමක් අවශ්‍ය නැත.

එවන් තත්ත්වයක් යටතේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදීම සඳහා විපක්ෂයට ඇත්තේ ඉතා ඉහළ වගකීමකි. නමුත් කනගාටුවට කරුණ වන්නේ රටට අවශ්‍යම මොහොතේ විපක්ෂය බෙදී වෙන්ව කුලල් කා ගැනීමය. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය මේ මොහොතේ පක්ෂය තුළ පවතින අභ්‍යන්තර අර්බුද හමුවේ බොහෝ කාලයක් මිඩංගු කරන්නේ රට ගමන් කරන මේ ඒකාධිපති අනතුරින් මුදවා ගැනීමට ජනතාව දැනුවත් කරනවාට වඩා ආණ්ඩුවට පක්ෂව ඡන්දය දෙතැයි සිතන එජාප මන්ත්‍රීවරුන් පස්සේ පැන්නීමටය. මේ හේතුවෙන් අනෙකුත් පක්ෂද සිටින්නේ දුර්මුඛවය. ඒකාබද්ධ විපක්ෂයක අවශ්‍යතාවය අවස්ථා කිහිපයකදීම අවධාරණය කෙරුණත් මේ මොහොතේ එය ඇත්තේ ක්‍රියාවෙන් ඔප්පු කරනවාට වඩා වචනයට පමණක් සීමා වීය. කෙටියෙන් කියතොත් අද රටට විපක්ෂයක් නැත.

ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක් බිහි කිරීමේදී ශක්තිමත් විපක්ෂයක් පැවතීම අත්‍යවශ්‍ය ලක්ෂණයකි. ශක්තිමත් විපක්ෂයක් නොවූ තැන බිහිවන්නේ ඒකාධිපති පාලනයකි. අද රටෙහි ඇත්තේ දියාරු වී ගිය විපක්ෂයකි. ඒ නිසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ජනාධිපති ධුරයේ වාර ගණන දිගු කරමින් 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරමින් මේ ගමන් කරන්නේ ඒකාධිපතිත්වයක් කරා මිස ප්‍රජාතන්ත්‍ර වාදී පාලනයකට නම් නොවේ. එජාපය ප්‍රමුඛ විපක්ෂය මේ ව්‍යසනයට සම්පූර්ණයෙන්ම වගකිව යුතුව ඇත.